# කෑරගල පද්මාවතී මහ පිරිවෙනට අයත් ටැම්පිට විහාරය

එම්. එල්. පසිඳු ඉරෝෂණ්

සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
achiravirantha@gmail.com

---

කෑරගල පද්මාවතී පිරිවෙන කෝට්ටේ යුගයට අයත් බව සැලකෙන පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික මූලාශ්‍ර සහිත පුදබිමකි. මෙම පර්යේෂණය හරහා කෑරගල පද්මාවතී පිරිවෙන ආශ්‍රිතව හඳුනාගත හැකි පුරාවිද්‍යාත්මක සාධක අතර ටැම්පිට විහාරය පිළිබඳ මූලික ගවේෂණයක් සිදු කිරීම අපේක්ෂිත ය. මෙහි සෙල්ලිපියට අනුව 6 වන පරාක්‍රමබාහු හෝ 6 වන විජයබාහු යුගයේ මෙම පිරිවෙන ස්ථාපිත කර තිබේ.

මෙහි වැදගත්ම පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස ටැම්පිට විහාරය දැක්විය හැකිය. ටැම් කුළුණු 8ක් දනට ඉතිරිව ඇති මෙහි පෙර තවත් ටැම් තිබෙන්නට ඇතැයි සිතිය හැකි කැඩී ගිය කොටස් කිහිපයක් දකගත හැකිය. පට්ටම් 12 කින් යුත් කුළුණක් අඩි 8ක් පමණ උස ය. අඩි 3ක් පොළොවට ඉහළින් ලතා කර්ම දකගත හැකි ය. අශෝක ස්තම්භවල ඇති අධෝවෘත්ත නෙළුම් පතෙහි ආකෘතියත් මෙහි වේ. සම්පූර්ණ කැටයම් සහිත කුළුණු සහ කැටයම් අඩු උඩු ශීර්ෂයක් රහිත කුළුණු වශයෙන් දෙවර්ගයක් දකගත හැකි ය. දුර්ලභ ලණු ගැටය මෝස්තරය, හංස රූව සහිත දිගටි ලණු ගැටය, සතර පැති මල් රවුම් සහිත නෙළුම් කැටයම් මෙහි වේ. කැටයම් රහිත සඳකඩපහණ් ආකෘති 5ක් වන අතර ප්‍රධාන දොරටු අසල අර්ධයකට වඩා වෘත්තාකාර නොවූ ඒ මැද කුඩා වෘත්තයක් මත තනි කලු ගලින් තැනූ ආකෘතිය සුවිශේෂ විය. මෙම ස්ථානයෙන් ටැම්පිට විහාරයට පරිබාහිර තවත් සාධක හඳුනාගෙන ඇති අතර ඒ පිළිබඳ ව ඉදිරියේ දී පර්යේෂණ සිදු කිරීමට නියමිත ය.

ප්‍රමුඛ පද : කෑරගල පද්මාවතී පිරිවෙන, ටැම්පිට විහාරය, කුළුණු, කැටයම්